ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව -6 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I-2023/2024

**LLU6715/ LWU4323 -කම්කරු නීතිය**

කාලය පැය එකයි

දිනය- **2024.11.08** වේලාව- ප.ව 3.30 - ප.ව 4.30

එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. රජිත් ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ කෘෂි රසායන සමාගමකට අයත් ප්‍රාදේශීය කාර්යාලයක පර්යේෂණ නිලධාරියෙකු වශයෙන් සේවය කරයි. ඔහුගේ වගකීම් අතරට ගොවියන් මුණ ගැසීම සහ සමාගමේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා සතියට දින තුනක් ක්ෂේත්‍ර සංචාර පැවැත්වීම ඇතුළත් වේ. ක්ෂේත්‍ර සංචාර අතරදී රජිත් සමාගමේ සන්නාමය සහිත ටී ෂර්ටයක් අනිවාර්යෙන්ම ඇඳිය යුතු වුවද පැමිණීමේ ලේඛණයක් අත්සන් කිරීම අවශ්‍ය නොවේ. ගමනාගමනය සඳහා ඔහු තමන්ගේම මෝටර් බයිසිකලය පාවිච්චි කරයි. ඊට අමතරව රජිත් දේශීය කෘෂි රසායන අලෙවි නියෝජිතයින් සමග නිරන්තර සන්නිවේදනයන් පවත්වා ගනිමින් එහි ප්‍රගතිය ප්‍රධාන කාර්යාලයට වාර්තා කරයි. සතියේ ඉතිරි දින දෙක තුළදී රජිත් තම ක්ෂේත්‍ර වැඩ කටයුතු හා ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා පොලොන්නරුවේ පිහිටි ප්‍රාදේශීය කාර්යාලයට වාර්තා කරයි. ඔහුගේ වැටුප් ගෙවීම කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් සිදු වන අතර ඔහු ගොවියන්ට අලෙවි කරන කෘෂි රසායන අනුව කොමිස් මුදලක්ද උපයා ගනී. මෑතකදී සමාගම විසින් රජිත්ගේ සේවය අවසන් කරන ලදී . රජිත් තම සේවා සමාප්තිය සඳහා වන්දි ඉල්ලා සිටි අවස්ථාවේදී ඔහු සේවකයෙකු නොව නිදහස් ගිවිසුම්කරුවකු බව දක්වමින් සමාගම එය ප්‍රතික්ෂේප කරයි.
සමාගම සමග වූ රජිත්ගේ සේවා සබඳතාව මගින් සංස්ථාපනය වන්නේ සේවා ගිවිසුමක්ද සේවය සැපයීම සඳහා වූ ගිවිසුමක්ද යන්න සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාළ නෛතික අධිකාරීන් මත පදනම් විය යුතුය. **(ලකුණු 20)**

2. "සේවය අවසන් කිරීමක් සම්බන්ධයෙන් පරිවාසිකයෙකුට සහන ප්‍රදානය කළ යුත්තේ සේවායෝජකයා අසද්භාවයෙන් (*mala fide*) කටයුතු කර ඇත්නම් පමණක් බවට අපේ අධිකරණය විසින් මූලධර්මයක් නියම කොට ඇත. එසේ හෙයින් සේවා සමාප්තියේ පදනම තනිකරම විමර්ශණය කරනු ලබන්නේ අසද්භාවී අංගය පවතිනවාද යන්න තහවුරු කර ගැනීමේ සීමිත අරමුණ සඳහාම පමණි."
*S. Egalahewa, A General Guide to Sri Lanka Labour Law, 2018 at p.96*
ඉහත ප්‍රකාශය මගින් ශ්‍රී ලංකාවේ පරිවාසික සේවා නියුක්තිය සම්බන්ධව පවතින වර්තමාන නෛතික තත්වය නිවැරදිව පිළිබිඹු කරයිද? අදාළ නෛතික අධිකාරීන් යොදා ගනිමින් ඔබේ පිළිතුරට හේතු දක්වන්න. **(ලකුණු 20)**

*- හිමිකම් ඇවිරිණි-*